රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 21/2018

මගේ අංකය : ES/1/ චක්‍රලේඛ
රාජ්‍ය පරිපාලන,කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.09.28

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 වන ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම</u>**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 බලාත්මක වන දින සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් උක්ත චක්‍රලේඛයේ විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාවය ලබා ගත යුතු බැවින්, 2007.07.01 දින සිට 2012.05.15 දින දක්වා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි සඳහන් වන පළමු කාර්යක්ෂමතා කඩඉමට අයත් දෙවන භාෂා වාචික පරීක්ෂණය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට තීරණය කර ඇත.

02. දැනටමත් 2007.07.01 දිනට පසු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගන්නා ලද, පත්වීම් ලිපියෙහි සඳහන් වන දෙවන රාජ්‍ය භාෂා වාචික ප්‍රවීණතාවය නියමිත දිනට සම්පූර්ණ නොකිරීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීහී 111 වගන්තිය යටතේ පරිවාස කාලය දීර්ඝ කර පත්වීම ස්ථිර කරන ලද නිලධාරීන් වේ නම්, එම පරිවාස කාලය දීර්ඝ කිරීම සංශෝධනය කිරීම සඳහා අදාල ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා මෙම අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.

03. එසේම සේවා ව්‍යවස්ථාවේ අන්තර්කාලීන විධිවිධාන අනුව උසස් වීම් ලැබීමට සුදුසුකම් ලබන 2007.07.01 දිනට පසු සේවයට බඳවාගෙන ඇති නිලධාරීන්, පත්වීම් ලිපියේ සඳහන් විධිවිධාන අනුව **<u>හෝ</u>** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා අනුෂාංගික චක්‍රලේඛයන්ට අදාල විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය, අදාළ උසස්වීම් ලබා ගැනීම සඳහා සම්පූර්ණ කර තිබිය යුතු වේ.

04. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදී.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය